වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT 2022

1990 සුව සැරිය පදනම
1990 சுவசெரிய அறக்கட்டளையின்
1990 SUWA SERIYA FOUNDATION

වාර්ෂික වාර්තාව
2022

1990 සුව සැරිය පදනම

පටුන

මෙහෙවර, දැක්ම සහ පරමාර්ථය 2
ආයතනික තොරතුරු 3
සභාපතිතුමාගේ පණිවුඩය 5
ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ වාර්තාව 8
ආයතනික පාලන වාර්තාව 9
විගණන කමිටු වාර්තාව 10
මෙහෙයුම් කාර්යසාධනය 12
පරිත්‍යාග 15
මහජන දැනුවත් කිරීම් 16
මූල්‍යමය ක්‍රියාකාරීත්වය 17
විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන් 17
විගණකාධිපති වාර්තාව 33

මෙහෙවර, දැක්ම සහ පරමාර්ථය

1990 සුව සැරිය පදනමේ මෙහෙවර, දැක්ම සහ පරමාර්ථය,

"ජීවිතයක් සුරැකීම"

යන එකම අභිමතාර්ථය පමණක් පෙරදැරි කරගෙන ස්ථාපනය කර ඇති අතර තවදුරටත් සිදුවන සංවර්ධන කටයුත්තක් හෝ වැඩි දියුණු කිරීමක් සිදුවන්නේ තවත් ජීවිත බේරා ගන්නේ කෙසේද යන්න මත පදනම්වය.



ආයතනික තොරතුරු

නෛතික රාමුව

2018 ජූලි මස 4 වන දින රජය විසින් 1990 සුව සැරිය පදනම පිහිටුවීම සඳහා අවශ්‍ය ගැසට් පත්‍රය ගැසට් කරන ලද අතර එය 2018 අංක 18 දරන පාර්ලිමේන්තු පනත මගින් බලාත්මක කරන ලදී.

ලියාපදිංචි කාර්යාලය

අංක. 415, කෝට්ටේ පාර, රාජගිරිය, ශ්‍රී ලංකාව

අධ්‍යක්ෂක මණ්ඩලය

පත් කරන ලද අධ්‍යක්ෂවරුන්

දුමින්ද්‍ර රත්නායක මහතා - සභාපති
සන්ධ්‍යා සල්ගාදු මහත්මිය
මහාචාර්ය අසිත ද සිල්වා මහතා
විජය මලලසේකර මහතා (2022.02.15 දක්වා)
විශ් ගෝවින්දසාමි මහතා (2022.06.07 සිට)

නියෝජිතයන්

නිල බලයෙන් පත් වූ මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ නියෝජිත :
චම්පිකා පතිරණ මහත්මිය (2022.02.27 දක්වා)
චන්ද්‍රිකා කුලතිලක මහත්මිය (2022.02.28 සිට)
නිල බලයෙන් පත් වූ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ නියෝජිත :
වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා
නිල බලයෙන් පත් වූ පොලිස්පතිවරයාගේ නියෝජිත :
නියෝජ්‍ය පොලිස්පති ඉන්දික හපුගොඩ මහතා

විගණකවරුන්

විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

බැංකු

ලංකා බැංකුව, ආයතනික ශාඛාව

ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්

ප්‍රධාන විධායක නිලධාරී : සොහාන් ද සිල්වා මහතා

ප්‍රධාන වෛද්‍ය නිලධාරී : වෛද්‍ය ශ්‍රීලාල් ද සිල්වා

මානව සම්පත් සහ පරිපාලන ප්‍රධානී : ගයත්‍රි ද සිල්වා මහත්මිය

පුහුණු සහ ප්‍රොටෝකෝල ප්‍රධානී : ගයාන් චතුරංග මහතා

හදිසි අණ සහ පාලන මධ්‍යස්ථාන (ECCC) ප්‍රධානී : මිරාජ් විජේසේකර මහතා

වැඩ බලන මූල්‍ය සහ සැපයුම් දාම කළමනාකරණ (SCM) ප්‍රධානී: චාමිකා හෙට්ටිආරච්චි මහත්මිය

මෙහෙයුම් කළමනාකරු : සචිරු රත්නායක මහතා

ප්‍රවාහන කළමනාකරු : රෝහණ වීරසිංහ මහතා

තත්ත්ව පාලන කළමනාකරු : ෂෙරින් ජොන්සන් මෙනවිය

ප්‍රාදේශීය කළමනාකරුවන් : ගාමිණී කුමාර මහතා සහ ආර්. ගෝපිනාත් මහතා

සභාපතිතුමාගේ පණිවුඩය

1990 සුව සැරිය පූර්ව රෝහල් ප්‍රතිකාරක සේවාව සය වසක් පුරාවට මෙරට මහජනතාව වෙත සිදු කරන ලද ලද අමිල මෙහෙවර පිළිබඳව 2022 වාර්ෂික වාර්ථාව මගින් ඉදිරිපත් කරනු ලබයි. 2022 වසරට අප අවතීර්ණ වූයේ කොවිඩ්-19 වසංගතයට ජයග්‍රාහීව මුහුණ දෙමිනි. 1990 සුව සැරිය පදනම, රජය විසින් කොවිඩ්-19 වසංගත තත්වය පාලනය කිරීමට ගන්නා ලද ශක්තිය පිටුපස පවුරක් මෙන් නොසැලී සිටියෙමු. 2022 වසර දෙස ආපසු හැරී බලන විට, අවශ්‍ය ඉන්ධන පහසුකම් නොමැතිකම, අත්‍යවශ්‍ය ඖෂධ සහ මූල්‍යාධාර හිඟකම එම වසර තුළ අප විසින් මුහුණ දුන් අභියෝග ලෙස දැක්විය හැකියි. ඒ සියළු අභියෝග හමුවේ වුවද නොසැලී මහජනතාව වෙත සේවය සැපයීමට අපට හැකියාව ලැබුණි.

මේ සියළු අභියෝග ජයගෙන නොසැලී සිටිමින් ශ්‍රී ලාංකික සියළු ජනතාව වෙත කාර්යක්ශම පූර්ව රෝහල් සත්කාරක සේවාවක් ලබා දීමට කැපවූ 1990 සුව සැරිය පදනමේ සියළු කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුද කර සිටිමි

දුමින්ද්‍ර රත්නායක
සභාපති
1990 සුව සැරිය පදනම

දුමින්ද්‍ර රත්නායක මහතා

දුමින්ද්‍ර රත්නායක මහතා විද්‍යාවේදී (ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු) උපාධියක් ලබා ඇති අතර, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකි. ඔහු සෙල්ටෙල් / ටීගෝ හා එටිසෙලාට් සමාගම්හි හිටපු ප්‍රධාන විධායක නිලධාරියා වන අතර ආයතන සහ පුද්ගලික සමාගම් කිහිපයක අධ්‍යක්ෂක මණ්ඩල තනතුරුවල කටයුතු කරයි. මීට අමතරව, ඔහු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති තනතුර ද දරා ඇත. 2018 වසරේ දුමින්ද්‍ර මහතා 1990 සුව සැරිය පදනමේ ආරම්භක සභාපතිවරයා ලෙස පත් වූ අතර, පදනම මෙරට වඩාත් කාර්යක්ශම රාජ්‍ය ආයතනයක් බවට කළමණාකරනය කරමින් මෙහෙයවයි

විද්‍යා ජෝති මහාචාර්ය. අසිත ද සිල්වා මහතා

මහාචාර්ය අසිත උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබා ඇති අතර ඔක්ස්ෆර්ඩ්හි රැඩ්ක්ලිෆ් රෝහලේදී සායනික ඖෂධවේදය පිළිබඳ පශ්චාත් උපාධි පුහුණුව ලබා ඇත. මහාචාර්ය අසිත කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සායනික ඖෂධවේදියකු සහ ඖෂධවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු වන අතර කැලණිය විශ්වවිද්‍යාලයේ සායනික පරීක්ෂණ ඒකකයේ අධ්‍යක්ෂවරයා ද වේ. එසේම ඔහු ලන්ඩනයේ රාජකීය වෛද්‍ය විද්‍යාලයේ සාමාජිකයෙකි. ඔහු New England Journal of Medicine, Lancet, JAMA, Clinical Science and Stroke සහ PLoS Medicine වැනි බොහෝ විද්‍යාත්මක සඟරා හි ලිපි ප්‍රකාශයට පත් කර ඇත. 2019 දී මහාචාර්ය අසිත විද්‍යාවට කළ වටිනා දායකත්වය වෙනුවෙන් ජාතික ගෞරව විද්‍යා ජ්‍යෝති සම්මානයෙන් පිදුම් ලැබීය.

සන්ධ්‍යා සල්ගාදු මහත්මිය

සන්ධ්‍යා මහත්මිය කැලණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය සහ ඕස්ට්‍රේලියාවේ එඩිත් කෝවන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA-ජාත්‍යන්තර) ලබා ඇති අතර, එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකාවක් (MCIM) ද වේ. Ogilvy Action හි අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිණිය ලෙස සේවය කර ඇති සන්ධ්‍යා මහත්මිය ලෝක බැංකු අරමුදල් සපයන ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති රැසකට ඉමහත් දායකත්වයක් ලබා දී ඇති පළපුරුදු සන්නිවේදන විශේෂඥවරියක් සහ ව්‍යාපාරික උපදේශකවරියකි. 2018/19 හි Women in Management, IFC, සහ Australian Aid විසින් ප්‍රදානය කරන ලද “Woman of Inspiration” ඇතුළු බොහෝ පදවි නාමවලින් ගෞරවයට පාත්‍ර වී ඇත. දැනට, ඇය ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA)/ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශකවරියක් ලෙස සේවය කරයි.

විශ් ගෝවින්දසාමි මහතා

විශ් මහතා විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ හාට්ෆෝඩ් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA) ලබා ඇත. ලංකා වාණිජ මණ්ඩලයේ සභාපති, ලංකා සේවා යෝජකයින්ගේ සම්මේලනය, ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ කවුන්සිලයේ සභික, වෙළඳ සේවා අර්ථසාධක සංගමයේ කමිටු සාමාජික, ශ්‍රී ලංකා ඖෂධ කර්මාන්ත මණ්ඩලයේ හිටපු සභාපති යනාදී ලෙස ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විවිධ තනතුරු දරා ඇත. කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉන්දු ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු සභාපතිවරයා ද වේ. දැනට විශ් මහතා සන්ෂයින් හෝල්ඩින්ග්ස් පී.එල්.සී (CSE•SUN), වටවල වැවිළි සමාගම, වටවල කිරි නිෂ්පාදන සමාගම, සන්ෂයින් විල්මා පෞද්ගලික සමාගම, ටාජ් ලංකා හොටේල්ස්, සහ සොෆ්ට්ලොජික් ජීවිත රක්ෂණ සමාගමෙහි හි අධ්‍යක්ෂ/සභාපති ධූර දරයි.

වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා

වෛද්‍ය සුනිල් මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් වෛද්‍ය විද්‍යාව හා ශල්‍යවේදී උපාධිය ලබා ඇති අතර ඔහු විද්‍යාපති උපාධිය (ප්‍රජා වෛද්‍ය විද්‍යාව) සහ වෛද්‍ය විද්‍යාව (වෛද්‍ය පරිපාලනය) පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ද, වයඹ විශ්වවිද්‍යාලයෙන් පාරිසරික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ලබා ඇත. වෛද්‍ය සුනිල් මහතා වෛද්‍ය නිලධාරියකු ලෙස සේවය කර 1997 වසරේ දී වෛද්‍ය අධිකාරිවරයෙකු ලෙස උසස්වීම් ලබා වෛද්‍ය පරිපාලන සේවයට ඇතුළත් වී ඇත. අනතුරුව 2001 වසරේ වයඹ පළාතේ සෞඛ්‍ය සේවා පළාත් අධ්‍යක්ෂවරයකු ලෙස උසස්වීම් ලැබූ ඒ මහතා 2012 වසරේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් විය. දැනට වෛද්‍ය සුනිල් මහතා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) ලෙස කටයුතු කරයි.

චන්ද්‍රිකා කුලතිලක මහත්මිය

චන්ද්‍රිකා මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවේදී උපාධියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. ඇය තැපැල් දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීවරිය ලෙසත්, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරියක් ලෙසත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂවරියක් ලෙසත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක් ලෙසත් කටයුතු කළාය. දැනට ඇය කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරියයි.

නියෝජ්‍ය පොලිස්පති ඉන්දික හපුගොඩ මහතා

ඉන්දික මහතා ලබා ඇති වෙනත් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් අතර ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යායතනයෙන් සැපයුම් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA) ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් අපරාධ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව ද වේ. 1998 දී උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණු ඉන්දික මහතා 2021 වර්ෂයේ දී නියෝජ්‍ය පොලිස්පති නිලයට පත් කිරීමෙන් අනතුරුව දැනට රථවාහන පරිපාලනය සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස සේවය කරයි ඔහු 2008-2010 කාලයේදී නැගෙනහිර ටිමෝරයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා රාජකාරි ඉටු කර ඇත. ඔහු ඉන්දියාව, චීනය, තායිලන්තය, වියට්නාමය, සිංගප්පූරුව සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල පැවති පුහුණු වැඩසටහන් රැසක ද නිරත වී ඇත..

ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වාර්තාව

2022 යනු කොවිඩ්-19 වසංගතයේ බොහෝ අභියෝග සාර්ථකව ජය ගැනීමට කරන ලද අපගේ උත්සාහයන්ගෙන් වෙහෙසට පත්ව ආරම්භ වූ වසරකි. මෙම වසර පුරාවටම අප ඉන්ධන සහ අත්‍යවශ්‍ය ඖෂධ වල හිඟකම නිසා අතිශය පීඩාවට පත් විය. කෙසේ වුවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පරිත්‍යාගශීලීන්ගේ සහ අනෙකුත් හිතවතුන්ගේ නොමද සහයෝගය සහ පරිත්‍යාග කිරීම් හමුවේ එම අභියෝග සියල්ලම මනාලෙස කළමණාකරනය කර ගැනීමට අපට හැකියාව ලැබුණි. ඉන්ධන අර්බුධයේ උච්චතම අවස්ථාවලදී පවා දිනකට සිද්ධීන් 1700 ක ප්‍රමාණයක් හසුරුවමින් මහජනතාවගේ ජීවිත බේරා ගැනීමට අපට හැකියාව ලැබුණි.

මෙම ගිලන් රථ සේවාව ඉහළ මට්ටමක පවත්වා ගනිමින් කිසිදු ගැටළුවකින් තොරව ඉදිරියට ගෙනයාමට යාමට 1990 සුව සැරිය පදනමේ සියළුම සාමාජිකයන් දරන වෑයම වෙනුවෙන් ඔවුන් වෙත මාගේ ස්තුතිය පුදකර සිටිමි. තවද, මාගේ කාර්යන් සාර්ථකව කරගෙන යාමට මා වෙත දැක්වූ සහයෝගය වෙනුවෙන් සභාපතිතුමා ඇතුළුව අධ්‍යක්ෂක මණ්ඩලයේ සියළු දෙනාටම මාගේ ස්තුතිය පුදකර සිටිමි.

සොහාන් ද සිල්වා
ප්‍රධාන විධායක නිලධාරි
1990 සුව සැරිය පදනම

ප්‍රධාන විධායක නිලධාරියාගේ පැතිකඩ

සොහාන් ද සිල්වා මහතා 1990 සුවසැරිය පදනමේ පළමු සහ වත්මන් ප්‍රධාන විධායක නිලධාරියා වේ. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 20කට වැඩි පළපුරුද්දක් ඇති සොහාන් මහතා ඩිජිටල් පරිවර්තනය සහ තාක්ෂණය පදනම් කරගත් ක්‍රියාත්මක කිරීම, ක්‍රියාවලි කළමනාකරණය සහ මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ විශේෂඥයෙකි. 2018 වසරේදී ඔහු 1990 සුව සැරිය පදනමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ භූමිකාවට පිවිසියේය. ඔහු මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියක් සහ ඕස්ට්‍රලියාවෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA) ලබා ඇත. හදිසි සහ ආපදා කළමනාකරණය සමග තාක්ෂණික දියුණුව ඒකාබද්ධ කිරීමේ ඔහුගේ ආශාව සහ ප්‍රවීණත්වය මත කැනඩාවේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ කීර්තිමත් ආයතනවලින් ආපදා කළමනාකරණය පිළිබඳ සුදුසුකම් කිහිපයක් ඔහුට ලබා දී ඇත. සොහාන් මහතා බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සහ හදිසි අවස්ථා කළමනාකරුවන්ගේ ජාත්‍යන්තර සංගමයේ ද සාමාජිකයෙකි. ඔහු හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳ කර්මාන්ත පදනම් කරගත් සහතික කිහිපයක් ද සපුරා ඇත.

ආයතනික පාලන වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලය

1990 සුවසැරිය පදනමේ පරිපාලන සහ කළමනාකරණ කටයුතු කැපවූ පුද්ගල කණ්ඩායමකින් සමන්විත අධ්‍යක්ෂක මණ්ඩලයකට පවරා ඇත. මණ්ඩලය සාමාජිකයින් හත් දෙනෙකුගෙන්, එනම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ පොලිස්පති නියෝජනය කරන නිලබලයෙන් පත්වන සාමාජිකයින් තිදෙනෙකු සහ වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය තාක්ෂණය, මූල්‍ය, කළමනාකරණය, පරිපාලනය, නීතිය යන ක්ෂේත්‍රවල අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ජනාධිපතිවරයා විසින් පත් කරන ලද තවත් සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම සාමාජිකයින් 2018 වසරේ පදනම ආරම්භයේ සිටම මෙම සේවාව රටේ හොඳම ජාතික සෞඛ්‍ය අංශයේ සේවාවන්ගෙන් එකක් බවට පත් කිරීම සඳහා මගපෙන්වීම්, උපදෙස් සහ සහාය ලබා දෙමින් ගෞරවනීය ධාරිතාවයකින් මණ්ඩලයට සේවය කරයි. සමාලෝචිත කාල සීමාව තුළ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් නවයක් පවත්වා ඇති අතර අධ්‍යක්ෂක මණ්ඩලය මාසිකව සහ අමතරව සූදානම් කරන ලද විශේෂ රැස්වීම් හිදී රැස්වේ.

විගණන කමිටුව

විගණන කමිටුව පිහිටුවා ඇත්තේ යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලවය. විගණන කමිටුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත් කරනු ලබන අතර පදනමේ අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා කමිටුවේ මුලසුන හොබවයි. විගණන කමිටුව ස්වාධීනව පදනමේ ක්‍රියාකාරකම් පරීක්ෂා කර ඇගයීමට ලක් කරයි. සමාලෝචිත කාල සීමාව තුළ විගණන කමිටු රැස්වීම් තුනක් පැවැත්විණි. විගණන කමිටු වාර්තාව 10-11 පිටුවල දක්වා ඇත.

අභ්‍යන්තර පාලනය

පදනමේ සියලුම කාර්යයන් නිසි ලෙස අවසර දී ඇති ආකාරයට සිදුවන ලෙසට අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යන බව සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුව ඇත. මානව සම්පත් සහ පරිපාලන, මූල්‍ය සහ සැපයුම් දාම කළමනාකරණ (SCM), හදිසි අණ සහ පාලන මධ්‍යස්ථාන (ECCC), මෙහෙයුම්, ප්‍රවාහන, පුහුණු සහ ප්‍රොටෝකෝල, සහ තත්ත්ව පාලන සඳහා නිශ්චිත ක්‍රියාකාරකම් සමගින් නිර්මාණය කර ඇති දෙපාර්තමේන්තු සමග ක්‍රීයාකාරී සංවිධාන ව්‍යුහයක් ක්‍රියාත්මක වේ. එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සෘජුවම පදනමේ ප්‍රධාන විධායක නිලධාරී වෙත වාර්තා කරයි.

විගණන කමිටු වාර්තාව

විගණන කමිටුව අත්‍යවශ්‍යයෙන්ම මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් වැනි ක්ෂේත්‍රවල කළමනාකරණ මණ්ඩලයට සිය වගකීම් ඉටුකර ගැනීම සඳහා උපාය මාර්ගික කාර්යභාරයක් ඉටු කරන කමිටුවකි. විගණන කමිටුවේ මුලසුන දරන්නේ විධායක අධ්‍යක්ෂවරයෙකු වන අතර තවත් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ද සාමාජිකයින් වේ. කමිටුවට ජ්‍යෙෂ්ඨ සහායක කාර්ය මණ්ඩලයේ සහාය ලැබෙන අතර, කමිටුවේ රාජකාරි ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය හා විගණන විශේෂඥතාවක් ඇත.

විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටු ප්‍රඥප්තිය

රාජ්‍ය ව්‍යාපාරයන්හි විගණන කමිටු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 01/2021 දරන චක්‍රලේඛය මගින් පාලනය වේ.

ප්‍රධාන අවධානය

විගණන කමිටුව මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සහ මෙහෙයුම් කාර්යයන් පිළිබඳ ස්වාධීන සහ වෛෂයික සමාලෝචනයක් ලබා දීමෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සිය රාජකාරි ඉටු කිරීමට සහාය වීම කෙරෙහිය.

කමිටුවේ රැස්වීම්

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් තුනක් (03) පැවැත්විණි. විගණන කමිටු රැස්වීම් වාර්තා සටහන් කර අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා කරන ලදී. විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ලෙස විගණන අධිකාරීවරයා රැස්වීම්වලට සහභාගි විය. රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විගණන කමිටුවේ ආරාධනය මත රැස්වීම්වලට සහභාගි විය.

2022 වසරේ පළමු රැස්වීමට පෙර කාරක සභාවේ සංයුතිය වෙනස් වූ අතර 2022 වසරේ පැවති රැස්වීම් සඳහා කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත දැක්වේ:

අධ්‍යක්ෂකවරයාගේ නම	කමිටුවේ දරන ධුරය	සහභාගි වූ රැස්වීම් ගණන
චම්පිකා පතිරණ මහත්මිය	සභාපතිනිය	0/0 (2022.02.21 දක්වා)
චන්ද්‍රිකා කුලතිලක මහත්මිය	සභාපතිනිය	3/3 (2022.02.28 සිට)
වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා	ඡාමාජික	2/3
සන්ධ්‍යා සල්ගාදු මහත්මිය	ඡාමාජික	2/3

2022 වර්ෂයේ දී කමිටුව විසින් ;

- 2020 සහ 2021 වර්ෂයන් සඳහා මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව එහි කටයුතු පිලිබඳව ඉදිරිපත් කරන ලදී.විස්තරාත්මක විගණකාධිපති වාර්තවන් සමාලෝචනය කරන ලද අතර විගණන විමසුම් සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රතිචාර සමාලෝචනය කර එහි සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම සහ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සමාලෝචනය කරන ලදී.
  විස්තරාත්මක විගණකාධිපති වාර්තාවන් හි පසු විපරම් ක්‍රියා ලෙස,
  - වෛද්‍ය සැපයුම් අංශයෙන් ඖෂධ ලබා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාවට නංවා ඇත. වෛද්‍ය සැපයුම් අංශයෙහි ප්‍රසම්පාදන සැලැස්මට අපගේ වාර්ෂික ඖෂධ සහ පරිභෝජන අවශ්‍යතා ඇතුළත් කර ගන්නා ලදී.
  - නව ටොයෝටා ගිලන්රථ 25 භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට රේඛීය අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා ආරම්භ කර මුදල් අමාත්‍යාංශයෙන් ප්‍රාග්ධන වියදම් අයවැය ප්‍රතිපාදන සම්මත කර ගන්නා ලදී.

- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
  - පදනම පිහිටුවීමට පෙර සිදු වූ ආපසු අයකරගත නොහැකි වූ රුපියල් මිලියන 2.5 ක මුදලක් 2022 මූල්‍ය ප්‍රකාශනවලින් නිරවුල් කිරීමට අවශ්‍ය පසුබිම විමර්ශනය කිරීමට සහ එම ක්‍රියාවලිය ආරම්භ කිරීමට කමිටුවක් පත් කරන ලදී.

- 2022 වර්ෂයේදී පදනම මුහුණදුන් මෙහෙයුම් ගැටළු පිළිබඳව සාකච්ඡා කරන ලද අතර විගණක කමිටුවේ නිර්දේශ මත කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ සමාලෝචනය කරන ලදී.
  - 2022 වර්ෂය සඳහා රජයෙන් ලද මූල්‍ය ප්‍රතිපාදන පදනමේ අයවැය අවශ්‍යතාවයට ප්‍රමාණවත් නොවූ අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා ආරම්භ කර 2022 වසර සඳහා අතිරේක අයවැය ප්‍රතිපාදන ලබා ගන්නා ලදී.
  - පදනමෙන් සේවකයින් ඉවත් වීමේ අවදානම පිළිබඳව සාකච්ඡා කරන ලදී.
  - සේවක සංඛ්‍යා පරතරය සහ අනුමත සේවක සංඛ්‍යාව වැඩි කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සාකච්ඡා කරන ලදී.

බාහිර විගණනය

2018 අංක 19 ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා ලෙස පත් කරන ලදී. විගණකාධිපති විසින් පත් කරන ලද විගණන අධිකාරී සහ ඔහුගේ කාර්ය මණ්ඩලය, පදනමේ බාහිර විගණන කටයුතු සම්බන්ධීකරණය කරයි.

නිගමනය

විගණන කමිටුවේ මතය වන්නේ විගණන කමිටුවේ නිර්ණේය විෂයන් සියලු ප්‍රමාණාත්මක අංගයන් ආවරණය කර ඇති බවයි.

විගණන කමිටුව වෙනුවෙන්

චන්ද්‍රිකා කුලතිලක
සභාපති - විගණන කමිටුව
2023 මාර්තු 20

මෙහෙයුම් කාර්යසාධනය

ලද හදිසි ඇමතුම් ගණන

2022 වර්ෂයේ දී	ආරම්භයේ සිට
1,219,020	5,936,294



හදිසි ප්‍රතිචාර නිලධාරීන් 25ක් මගින් *

සහභාගිවන ලද හදිසි අවස්ථා

2022 වර්ෂයේ දී	ආරම්භයේ සිට
344,623	1,385,817



හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් 648ක් සහ ගිලන්රථ රියදුරන් 574ක් මගින් *

* 2022.12.31 දිනට පවත්නා සේවක සංඛ්‍යාව



දිවයින පුරා
කි.මී. 9,871,739
ආවරණය කරන ලදී

ප්‍රතිචාර දැක්වීමේ
සාමාන්‍යය කාලය
මිනිත්තු 14 තත්පර 32



දිවයින පුරා හදිසි අවස්ථා ව්‍යාප්තිය



පරිත්‍යාග

පසුගිය වසරේ දී 1990 සුව සැරිය පදනම මුහුණ දුන් දුෂ්කරතා මගහරවා ගැනීම සඳහා ආධාර උපකාර කිරීමට පාර්ශව කිහිපයක් ඉදිරිපත් විය. හෘද රෝග විශේෂඥයන්ගේ විද්‍යායතනය (College of Cardiology) සහ අනෙකුත් සුභපතන්නන්ගෙන් මුදලින් රු. 2,026,047.49 ක් ලැබිණි. තවද, ඉන්දීය ජනතාව, කැනඩාවේ ඔන්ටාරියෝ හි මෙඩිකල් හෙල්ප් ශ්‍රී ලංකා, කටාර්හි ශ්‍රී ලාංකික ප්‍රජාව, එක්සත් ජනපද පරිත්‍යාගශීලීන්ගේ සංගමය සහ අනෙකුත් අනෙකුත් සුභපතන්නන් විසින් ඖෂධ, වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍ය සහ ටයර් පිරිනමන ලදී.

මහජන දැනුවත් කිරීම්

පසුගිය වසරේ දී නව මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබුවේ නැත. කෙසේ වෙතත්, 2021 දී ආරම්භ කරන ලද ගිලන්රථ සඳහා මාර්ගයේ ඉඩ ලබා දීම සඳහා විශේෂිත පරිත්‍යාගශීලීන් විසින් මූල්‍යයනය කරන ලද "මෙන්න හඬ - දෙන්න ඉඩ" මහජන දැනුවත් කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක විය.



මූල්‍යමය ක්‍රියාකාරීත්වය

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන්

1990 සුව සැරිය පදනම

2022 දෙසැම්බර් මස 31 දිනෙන්
අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන

1990 සුව සැරිය පදනම පිටුව 1

දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	2022.12.31 රු.	2021.12.31 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියක හා උපකරණ	4	1,032,711,371	571,997,088
මුළු ජංගම නොවන වත්කම්		1,032,711,371	571,997,088
ජංගම වත්කම්			
තොගය	5	54,947,491	57,357,699
අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	6	363,470,864	377,421,345
මුදල් සහ මුදල් හා සමාන දෑ	7	845,703,463	481,241,344
මුළු ජංගම වත්කම්		1,264,121,818	916,020,388
මුළු වත්කම්		2,296,833,189	1,488,017,475
අරමුදල් සහ වගකීම්			
සමුච්චිත අරමුදල			
නම් කරන ලද සංචිත - ප්‍රාග්ධනය - ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන	8	366,170,755	561,417,085
සීමා කරන ලද අරමුදල් - ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන	9	679,434,218	813,605,704
නම් කරන ලද සංචිත -ප්‍රාග්ධනය- ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රදාන	10	418,940,000	-
ප්‍රත්‍යාගණන සංචිතය	11	247,925,000	-
සමුච්චිත අතිරික්තය / (හිඟය)		241,701,344	(51,365,905)
මුළු සමුච්චිත අරමුදල		1,954,171,317	1,323,656,884
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	12	111,899,625	87,832,625
මුළු ජංගම නොවන වගකීම්		111,899,625	87,832,625
ජංගම වගකීම්			
වෙනත් ගෙවීම්	13	105,952,247	76,527,967
සීමා කරන ලද අරමුදල් - නව ගිලන් රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	14	124,810,000	-
මුළු ජංගම වගකීම්		230,762,247	76,527,967
මුළු වගකීම්		342,661,872	164,360,592
මුළු සමුච්චිත අරමුදල සහ වගකීම්		2,296,833,189	1,488,017,475

පිටු 5 සිට 15 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ ලාභ නොලබන සංවිධාන සඳහා නිර්දේශිත භාවිතය පිළිබඳ ප්‍රකාශනයට අනුකූලව සකස් කර ඇති බව සහතික කරමි.

....

මූල්‍ය ප්‍රධානී ප්‍රධාන විධායක නිලධාරි

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කර ඇත;

....

සභාපති / අධ්‍යක්ෂ අධ්‍යක්ෂ

2023 පෙබරවාරි **24**
කොළඹ.

1990 සුව සැරිය පදනම් පිටුව **2**

විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022.12.31ත් අවසන් වසර සඳහා රු.	2021.12.31ත් අවසන් වසර සඳහා රු.
මෙහෙයුම් ආදායම			
ලැබූ අදායම්	15	2,183,887,447	2,105,294,975
මුළු මෙහෙයුම් ආදායම		2,183,887,447	2,105,294,975
මෙහෙයුම් වියදම්			
සෘජු වියදම්	16	(1,964,369,430)	(1,959,096,604)
වක්‍ර වියදම්	17	(277,683,545)	(274,740,032)
මුළු මෙහෙයුම් වියදම්		(2,242,052,975)	(2,233,836,636)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ අතිරික්තය / (හිඟය)		(58,165,528)	(128,541,661)
වෙනත් ආදායම්			
වෙනත් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම	18	346,466,537	73,233,050
මූල්‍ය ආදායම්	19	4,766,240	3,942,706
මුළු අනෙකුත් ආදායම්		351,232,777	77,175,756
වසර සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)		293,067,249	(51,365,905)

පිටු 5 සිට 15 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

1990 සුව සැරිය පදනම්

පිටුව 3

සමුච්චිත අරමුදලේ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

	නම් කරන ලද සංචිත - ප්‍රාඥධන-ඉන්දියා රජයෙන් ලද ප්‍රදාන	සීමා කරන ලද අරමුදල්-ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන	නම් කරන ලද සංචිත - ප්‍රාඥධනය- ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන ප්‍රදාන	ප්‍රත්‍යාගණන සංචිත	සමුච්චිත අතිරික්තය /(හිඟය)	
	රු.	රු.	රු.	රු.	රු.	එකතුව රු.
2021 ජනවාරි 01 දිනට ශේෂය	743,467,107	932,975,592		-	-	1,676,442,699
වර්ෂය තුළ භාවිතා කරන ලද අරමුදල්	-	(57,294,975)	-	-	-	(57,294,975)
වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධිවූ සංචිත	(8,076,234)	-	-	-	-	(8,076,234)
වසර තුළ දේපළ, පිරියත සහ උපකරණ එකතු කිරීම් මාරු කිරීම	53,814,473	(53,814,473)		-	-	-
වර්ෂය තුළ වෙනත් මාරුකිරීම්	-	(8,260,441)	-	-	-	(8,260,441)
ක්ෂයවීම් හේතුවෙන් උපලබ්ධිවූ අරමුදල්	(227,788,260)	-		-	-	(227,788,260)
වසර සඳහා හිඟය	-	-	-	-	(51,365,905)	(51,365,905)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**561,417,085**	**813,605,704**	**-**	**-**	**(51,365,905)**	**1,323,656,884**
වර්ෂය තුළ භාවිතා කරන ලද අරමුදල්	-	(126,116,537)	-	-	-	(126,116,537)
වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධිවූ සංචිත	(637,936)	-	-	-	-	(637,936)
වසර තුළ දේපළ, පිරියත සහ උපකරණ එකතු කිරීම් මාරු කිරීම	8,054,949	(8,054,949)	418,940,000	-	-	418,940,000
ක්ෂයවීම් හේතුවෙන් උපලබ්ධිවූ අරමුදල්	(201,803,376)	-	-	-	-	(201,803,376)
මෝටර් රථවල ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	-	247,065,033	-	247,065,033
ප්‍රත්‍යාගණනය මත උපලබ්ධි නොවූ සංචිත	(859,967)	-	-	859,967	-	-
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)	-	-	-	-	293,067,249	293,067,249
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**366,170,755**	**679,434,218**	**418,940,000**	**247,925,000**	**241,701,344**	**1,954,171,317**

පිටු 5 සිට 15 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

1990 සුව සැරිය පදනම පිටුව **4**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2022.12.31න් අවසන් වසර සඳහා රු.	2021.12.31න් අවසන් වසර සඳහා රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් ශුද්ධ අතිරික්තය / (හිඟය)		293,067,249	(51,365,905)
අතිරික්ත / (හිඟය) ශුද්ධ මුදල් ප්‍රවාහයට සැසඳීම සඳහා ගැලපීම්:			
මුදල් නොවන අයිතම:			
ක්ෂය වීම	4	214,442,103	229,466,695
ප්‍රත්‍යාගණනය මත උපලබ්ධි නොවූ සංචිත	11	859,967	-
විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	12	24,967,000	26,025,875
වක්කම් බැහැර කිරීමේදී උපලබ්ධි වූ සංචිත	18	637,936	8,076,234
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය		533,974,255	212,202,899
ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂික	12	(900,000)	(550,000)
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය		533,074,255	211,652,899
කාරක ප්‍රාග්ධන ගැලපීම්:			
(වැඩි වීම) / අඩු වීම:			
තොගය	5	2,410,207	(19,199,735)
අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	6	13,950,481	55,839,807
වෙනත් ගෙවිය යුතු	13	29,424,281	10,988,976
සීමා කරන ලද අරමුදල් - නව ගිලන් රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ප්‍රාග්ධන ප්‍රදාන	14	124,810,000	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		703,669,225	259,281,947
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහය			
දේපල, පිරියක සහ උපකරණ මිලදී ගැනීම	4	(29,979,290)	(55,660,053)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		(29,979,290)	(55,660,053)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහය			
අරමුදල් ගිණුම් වැඩි වීම / (අඩු වීම).		(309,227,816)	(301,419,910)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		(309,227,816)	(301,419,910)
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම / (අඩු වීම)		364,462,119	(97,798,015)
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ		481,241,344	579,039,360
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	7	845,703,463	481,241,344

පිටු 5 සිට 15 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. සාමාන්‍ය තොරතුරු

1990 සුව සැරිය පදනම 2018 අංක 18 දරන පාර්ලිමේන්තු පනත යටතේ, එකී බලතල ප්‍රකාරව 2018 ජූලි 04 දින ස්ථාපිත කර ඇත.

1990 සුව සැරිය පදනම මඟින්, සේවකයින් 1307 දෙනෙකුගේ දායකත්වයෙන් සමන්විත දිවයින පුරා නොමිලේ පූර්ව රෝහල් හදිසි ප්‍රතිකාර ගිලන්රථ සේවාවක් සපයයි. පදනමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 415, කෝට්ටේ පාර, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇති අතර දිවයින පුරා මධ්‍යස්ථාන 295 ක් ඇත.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා වේ ලාභ නොලබන සංවිධාන සඳහා නිර්දේශිත පරිචයන් පිළිබඳ ප්‍රකාශයට (SL SoRP – NPOs) අනුකූලව සකස් කර ඇත.

2.2 මිනුම් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශනයන්හි සාධාරණ අගයෙන් දක්වා ඇති ඇති මූල්‍ය සුරැකුම් සහ මූල්‍ය මෙවලම් සම්බන්ධයෙන් හැර, ඓතිහාසික පිරිවැය සම්මුතිය භාවිතා කරමින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ පදනමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් (රු.) ය.

2.4 ඇස්තමේන්තු සහ නීන්දු උපයෝගී කර ගැනීම

ශ්‍රී ලංකා ලාභ නොලබන සංවිධාන සඳහා නිර්දේශිත පරිචයන් පිළිබඳ ප්‍රකාශයට (SL SoRP – NPOs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකාරිත්වයට ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගැනීමට සහ වාර්තා වූ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු සහ විනිශ්චයන්ගෙන් වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ බලපවත්වන උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු සංශෝධනය කරන කාල සීමාව තුළ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සංශෝධන ද හඳුනා ගනියි. සංශෝධන අනාගත කාලපරිච්ඡේදවලට බලපාන්නේ නම් එවැනි සංශෝධන අනාගත කාල පරිච්ඡේදවලදී ද හඳුනා ගනියි.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ඇති ප්‍රමාණ කෙරෙහි ඉතා වැදගත් බලපෑමක් සිදු කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ දී ඇස්තමේන්තු කිරීම්, අවිනිශ්චිතතාව සහ නිරණාත්මක විනිශ්චයන් සම්බන්ධ වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු පහත සටහන් තුළ ඇතුළත් කර ඇත.

- සටහන 4 – දේපළ, පිරියත සහ උපකරණ
- සටහන 12 – සේවක ප්‍රතිලාභ

2.5 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් සහ හෙළිදරව් කිරීම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් අඛණ්ඩව යෙදී ඇති අතර පෙර වසරවල භාවිතා කළ ඒවාට අනුකූල වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

3.1 විදේශ මුදල් පරිවර්තනය

විදේශ මුදල් ගනුදෙනු සංවිධානයේ ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරනු ලබන්නේ ගණුදෙණු කරන දිනවලදී පවතින විනිමය අනුපාත (spot exchange rate) භාවිතා කරමිනි. එවැනි ගණුදෙනු පියවීම නිසා සහ වසර අවසාන විනිමය අනුපාත යටතේ මුදල් අයිතම නැවත මැනීමෙන් ඇතිවන විදේශ විනිමය ලාභ සහ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

ඓතිහාසික පිරිවැයෙන් මනිනු ලබන මුදල් නොවන අයිතම නැවත පරිවර්තනය නොකෙරේ. සාධාරණ අගය මත මනිනු ලබන මුදල් නොවන අයිතම සාධාරණ අගය තීරණය කළ දිනයේ පවතින විනිමය අනුපාතවලට පරිවර්තනය කරයි.

3.2 මුදල් හා මුදල් සමාන දෑ

කලින් දන්නා මුදල් ප්‍රමාණවලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ අගය වෙනස් වීමේ අවදානමකට නොගැණිය හැකි ඉතාළ ද්‍රවශීලතාවක් සහිත කෙටිකාලීන ආයෝජනවලින් හා අත ඇති මුදල්වලින් සහ ඉල්ලුම් තැන්පතුවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, ශුද්ධ බැංකු අයිරාවලින් ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කර සකස් කර ඇත.

3.3 මූල්‍ය උපකරණ (Financial Instruments)

මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් පහත සඳහන් කාණ්ඩවලට වර්ග කර ඇත; ලාභය සහ අලාභය හරහා සාධාරණ අගයක් සහිත මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් තබා ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු මුදල්, සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම්.

ලාභ හා අලාභ හරහා සාධාරණ අගයකින් යුත් මූල්‍ය වත්කම්

ලාභය සහ අලාභය හරහා සාධාරණ අගයකින් යුත් මූල්‍ය වත්කම් ප්‍රංගම වත්කම් ලෙස වර්ග කර ඇති අතර, ඕනෑම ප්‍රතිඵලයක් සහ ලාභ හෝ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

ලැයිස්තුගත සුරැකුම්වල සාධාරණ අගය වනුයේ වාර්තා කරන දිනයේ දී ඒවායේ ලංසු තැබූ මිල වේ. මූල්‍ය ආදායම් ප්‍රධාන වශයෙන් පොලී සහ සාධාරණ අගයේ වෙනස්වීම් මත සාක්ෂාත් කර ගත් සහ සාක්ෂාත් කර නොගත් ශුද්ධ ලාභ වලින් සමන්විත වේ. වත්කමේ ඵලදායී ප්‍රතිලාභය සැලකිල්ලට ගනිමින් පොලී ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

ණය සහ ලැබිය යුතු දෑ

පළමුව, ණය සහ ලැබිය යුතු දෑ ඒවා ආරම්භ වූ දිනයේ දී හඳුනා ගනු ලබයි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් මුලින්ම හඳුනා ගනු ලබන්නේ වෙළඳ දිනයේදීය, එනම් පදනම ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශවකරුවෙකු වන දිනයවේ. නොගෙවීමේ අවදානම ආවරණය කිරීම පිණිස ණය සහ ලැබිය යුතු දෑ හිඟ මුදල් මත දීමනාවක් අඩු කර ශුද්ධ පිරිවැයට දක්වා ඇත.

මූල්‍ය වගකීම්

පදනමේ මූල්‍ය වගකීම්වලට සම්බන්ධ පාර්ශ්වයන්ට ගෙවිය යුතු සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුළත් වේ. මූල්‍ය වගකීම් මුලින් හඳුනාගනු ලබන්නේ ගනුදෙනු කළ මිලටය. මූලික සටහන් කිරීමෙන් පසුව, ඒවා මනිනු ලබන්නේ ක්‍රමක්ෂය කළ පිරිවැයෙනි. මෙම මූල්‍ය වර්ෂය තුළ ගෙවිය යුතු කිසිදු සම්බන්ධ පාර්ශවයක් හඳුනා නොගත්තෙමු.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය (සම්බන්ධිතයි)

3.3 මූල්‍ය උපකරණ (Financial Instruments) (සම්බන්ධිතයි)

මූල්‍ය වත්කම් අපහායනය

අපහායනයක් පිළිබඳ කිසියම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා එක් එක් වාර්තා කරන දිනයේදී මූල්‍ය වත්කමේ ධාරණ වටිනාකම සමාලෝචනය කෙරේ. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනය වී ඇති බවට කිසියම් වෛෂයික සාක්ෂි තිබේද යන්න පදනම් වසින් තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනය වූ ලෙස සලකනු ලබන්නේ වත්කම හෝ වත්කම් ලෙසින් හඳුනා ගැනීමෙන් අනතුරුව (දරන ලද "අලාභ සිදුවීමක්") සිදුවීම් එකක් හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස සිදුවන හානිය පිළිබඳ වෛෂයික සාක්ෂි තිබේ නම් පමණක් සහ එම පාඩු සිදුවීම මූල්‍ය වත්කම්වල හෝ මූල්‍ය වත්කම් සමූහයක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට බලපෑමක් ඇති කරන විට සහ එම බලපෑම පහසුවෙන් තක්සේරු කළ හැකි විට ය.

3.4 තොගය

යල්පැන ගිය සහ අඩුවෙන් භාවිත වන වන අයිතම සඳහා නිසි දීමනාවක් ලබා දීමෙන් පසු බඩු තොග සතාය පිරිවැය පදනම මත අගය කරනු ලැබේ.

3.5 දේපළ, පිරියත සහ උපකරණ

3.5.1 විධිමත්ව සටහන් කිරීම හා මිනුම් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම මගින් මනිනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ.

දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමවල කොටස් සඳහා එකිනෙක වෙනස් ඵලදායී අයු කාලයන් ඇති විට, එවැනි කොටස් දේපළ, පිරියත හා උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණන් ගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ ලාභ හෝ අලාභ තීරණය කරනු ලබන්නේ බැහැර කිරීමෙන් ලැබෙන ආදායම දේපළ, පිරියත සහ උපකරණ වල ඉදිරියට ගෙනයන වටිනාකම සමඟ සංසන්දනය කිරීමෙන් වන අතර එම ලාභ හෝ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

3.5.2 පසුව සිදුවන පිරිවැය

පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය දේපළ හා උපකරණ අයිතමයේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අනෙකුත් සියලුම වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දරන ලද වියදම් ලෙස හඳුනාගෙන ඇත.

3.5.3 නැවත තක්සේරු කිරීම

සාධාරණ අගය විශ්වසනීයව මැනිය හැකි දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් නැවත තක්සේරු කිරීමේ දිනයේදී එහි සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීමෙන් නැවත තක්සේරු කළ අගයකට ගෙන යා යුතුය. යම් දේපළ, පිරියත සහ උපකරණයක් පසුව නැවත ඇගයීමට ලක් කළ විට, එවැනි වත්කමක මුළු පන්තියම නැවත ඇගයීමට ලක් කෙරේ.

සාධාරණ අගය සහ ධාරණ වටිනාකම් අතර සැලකිය යුතු වෙනසක් ඇති විට, සාධාරණ අගය එහි ධාරණ වටිනාකමට වඩා සැලකිය යුතු වශයෙන් වෙනස් නොවන බව සහතික කිරීම සඳහා, වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු විසින් මෝටර් රථ සඳහා නැවත ඇගයීම් සිදු කරනු ලැබේ.

නැවත තක්සේරු කිරීම් හේතුවෙන් ධාරණ වටිනාකමේ වැඩි වීමක් නැවත තක්සේරු කිරීමේ අතිරික්තය යන ශීර්ෂය යටතේ සමුච්චිත අරමුදලට බැර කෙරේ. කෙසේ වෙතත්, එය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කලින් සටහන් කර ඇති එම වත්කමේ නැවත තක්සේරු කිරීමේ හිඟයක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට හැර වැඩි වීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ විධිමත්ව සටහන් කර ඇත. නැවත තක්සේරු කිරීමේ හිඟය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කලින් හඳුනාගෙන ඇති එම වත්කමේ නැවත තක්සේරු කිරීමේ අතිරික්තය පියවන ප්‍රමාණයට හැර වැඩි වීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කර ඇත. අපහරණයෙන් පසු, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාළ ඕනෑම නැවත තක්සේරු කරනලද අතිරික්තයක් විස්තීරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය **(සම්බන්ධිතයි.)**

3.5 දේපළ, පිරියත සහ උපකරණ (පෙර පිටුවෙන්)

3.5.4 ක්ෂය කිරීම්

අදාළ වත්කම්වල අපේක්ෂිත ඵලදායී ආයු කාලයට අනුව සරල රේඛීය පදනමක් මත සියලු වත්කම් සඳහා ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතයට ගන්නා විටදී වන අතර වත්කම් ක්ෂය වීම නතර වන්නේ එම වත්කම වීකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති දිනය සහ වත්කම භාවිතයට නොගත් දිනය දිනයන් වලින් පෙර දිනයේදී ය. ක්ෂයවීම් මාසික පදනම්වින් ගණනය කරනු ලබන අතර මිලදී ගත් මාසය සඳහා සම්පූර්ණයෙන් අය කෙරේ. වත්කම්වල ඵලදායී ආයු කාලයන් පහත පරිදි වේ:

වත්කම් වර්ගය	වසර ගණන
මෝටර් රථ- 1 අදියර (2022 සැප්තැම්බර් 30 දක්වා)	වසර 6
මෝටර් රථ- අදියර 2 සහ 3	වසර 6
කොරකුරු කාක්ෂණ උපකරණ	වසර 4
ගෘහ භාණ්ඩ සහ උපකරණ	වසර 8
වෛද්‍ය උපකරණ	වසර 8
මෘදුකාංග	වසර 5
මෙවලම්	වසර 5
කාර්යාලීය උපකරණ	වසර 5

අදියර 1 මෝටර් රථ 2022 ඔක්තෝම්බර් 31 වන දිනට නැවත තක්සේරු කර ඇති අතර එම මෝටර් රථවල අපේක්ෂිත ඵලදායී ආයු කාලය පහත පරිදි නැවත හඳුනා ගෙන ඇත;

වත්කම් වර්ගය	වසර ගණන
මෝටර් වාහන 15ක්	වසර 5
මෝටර් වාහන 61ක්	වසර 6
මෝටර් වාහන 05ක්	වසර 7
මෝටර් වාහන 04ක්	වසර 8

3.5.5 පරිත්‍යාග කළ වත්කම්

සීමිත අරමුදල් හරහා ව්‍යාපෘතියක කොටසක් ලෙස දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගන්නා විට, ව්‍යාපෘතිය අවසන් වූ පසු, වත්කම ප්‍රතිලාභියාට භාර නොදෙන්නේ නම් හෝ මුල් පරිත්‍යාගශීලියාට ආපසු ලබා නොදෙන්නේ නම්, ව්‍යාපෘතිය අවසන් වූ පසු වත්කම තක්සේරු කරන අතර ප්‍රාග්ධන සංචිතයක් හරහා දේපළ, පිරියත සහ උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන එන ලදී. එවැනි වත්කම්වල ක්ෂයවීම් සංචිතයට එදිරිව සිදු කෙරේ. ක්ෂය කිරීමේ අරමුණ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම පිණිස තක්සේරු දිනය මිලදී ගත් දිනය ලෙස සැලකේ.

3.5.6 වත්කම් අපහායනය

එක් එක් වාර්තා කිරීමේ දිනයකදී, වත්කම්වලට අලාභ හානි සිදුවී ඇති බවට කිසියම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ සමාලෝචනය කෙරේ. වත්කමක ධාරණ වටිනාකම එහි අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන සෑම අවස්ථාවකම අපහායන අලාභයක් හඳුනා ගැනේ. විස්තීරණ ආදායම් ප්‍රකාශයේ අපහායන අලාභ හඳුනාගෙන ඇත. අයකරගත හැකි මුදල තීරණය කිරීම සඳහා භාවිතා කරන ඇස්තමේන්තුවල වෙනසක් සිදුවී ඇත්නම්, අපහායන අලාභයක් ආපසු හරවන නමුත් කිසිදු අපහායන අලාභයක් හඳුනාගෙන නොමැති විට වත්කමේ ධාරණ අගය වනුයේ ක්ෂයවීම් හෝ ක්ෂයවීම්වල ශුද්ධ ප්‍රමාණය අනුව තීරණය කළ හැකි ධාරණ අගය ඉක්මවා නොයන තරමට පමණි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය (සම්බන්ධිතයි.)

3.6 සේවක ප්‍රතිලාභ

3.6.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් හැර වෙනත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් සමාගමේ ශුද්ධ බැඳීම එක් එක් සැලැස්ම සඳහා වෙන් වෙන් වශයෙන් ගණනය කරනු ලබන්නේ වත්මන් සහ පෙර කාල පරිච්ඡේදවලදී සේවකයින් ඔවුන්ගේ සේවය වෙනුවෙන් උපයා ඇති අනාගත ප්‍රතිලාභ ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමෙනි.

පදනම මගින් ගණනය කිරීම වාර්ෂික පදනම්න් සිදු කරනු ලැබේ. සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුකූලව සියලුම සේවකයන් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික දීමනා සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුව සේවකයකුට ගෙවීමේ වගකීම පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසුවය.

වගකීම බාහිර අරමුදල් මගින් මූල්‍යයනය කරනු නොලැබේ.

3.6.2 නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනයක් වෙනම ආයතනයකට ස්ථාවර දායකත්වයක් ගෙවන අතර අමතර මුදල් ගෙවීමට නීතිමය හෝ සාධනීය බැඳීමක් නොමැත. සියලුම සේවකයින් ආවරණය වන පරිදි සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය සඳහා වන බැඳීම් වියදම් දැරූ පරිදි ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනා ගනු ලැබේ.

පදනම අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල් දායකත්වය ලෙස සේවකයාගේ දළ වැටුපෙන් අනුපිළිවෙලින් 12% සහ 3% ලෙස දායක වේ.

3.7 ලැබීම් සහ අරමුදල්/සංචිත භාවිතය සඳහා ගිණුම්කරණය

සංචිත

සංචිත සීමා කරන ලද හෝ නම් කරන ලද සංචිත ලෙස වර්ග කර ඇත.

අ) නම් කරන ලද සංචිත / අරමුදල්

නිශ්චිත කාර්යයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරන ලද සීමා නොකළ අරමුදල් නම් කරන ලද අරමුදල් ලෙස හඳුනා ගැනේ. මෙම අරමුදල් භාවිතා කළ හැකි ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

ප්‍රාග්ධන ස්වභාවයේ හඳුනාගත් ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක භාවිතය සඳහා වත්කම්/අරමුදල් ලැබෙන්නේ නම්, එවැනි වත්කම් සහ එම අරමුදල්වලින් මිලදී ගත්නා වත්කම් නම් කරන ලද සංචිත-ප්‍රාග්ධන ගිණුමට මාරු කරනු ලැබේ.

ආ) සීමා කරන ලද සංචිත / අරමුදල්

හඳුනාගත් ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක භාවිතය සඳහා ප්‍රදාන ලැබෙන විට, එම අරමුදල් සීමා කරන ලද අරමුදල් ගිණුමක තබාගෙන එම හඳුනාගත් ව්‍යාපෘතියට අදාළව දරන ලද වියදම් සමඟ ගැලපීම් සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ. භාවිතයට නොගත් අරමුදල් ඔවුන්ගේ අදාළ අරමුදල් ගිණුම්වල තබා ඇති අතර ඒවා අවශ්‍ය වන තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සමුච්චිත අරමුදලට ඇතුළත් කර ඇත.

මෙම සීමා කරන ලද අරමුදල් භාවිතා කළ හැකි සහ භාවිතා කරන ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් වල හඳුනාගෙන ඇත.

ඇ) ප්‍රත්‍යාගණන සංචිතය

ප්‍රත්‍යාගණන සංචිතය දේපළ, පිරියත සහ උපකරණ නැවත තක්සේරු කරන ප්‍රමාණයන්ගෙන් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය (සම්බන්ධිතයි.)

3.8 ප්‍රදාන සහ සහනාධාර

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රදාන සහ සහනාධාර ඒවායේ සාධාරණ අගය මත හඳුනාගනු ලැබේ. ප්‍රදානය හෝ සහනාධාරය වියදමකට අදාළ වන විට එය ක්‍රමානුකූල පදනමක් මත නිලව් කිරීමට අදහස් කරන වියදම් සමඟ එය ගැලපීමට අවශ්‍ය කාල සීමාව තුළ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

වත්කම්වලට අදාළ ප්‍රදාන සහ සහනාධාර සාමාන්‍යයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙන් විලම්භනය කරනු ලබන අතර වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය මත විස්තීරණ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

3.9 ආදායම හඳුනාගැනීම

3.9.1 දායකත්ව / ආදායම් මූලාශ්‍ර

සීමා කරන ලද අරමුදල්වලින් ලැබෙන ආදායම විස්තීරණ ආදායම් ප්‍රකාශයන්හි හඳුනාගනු ලබන්නේ අරමුදල් ලැබීමේ සියලු කොන්දේසිවලට අනුකූලව කටයුතු කර ඇති බවට සහතිකයක් ඇති විට සහ නිලව් කිරීමට අපේක්ෂා කරන අදාළ වියදම් අයකර ඇති විට සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට අයකර ඇති විට පමණි. භාවිතයට නොගත් අරමුදල් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙන යනු ලැබේ.

අනෙකුත් සියලුම ආදායම් හඳුනා ගන්නේ එවැනි අරමුදල් භාවිතා කිරීමට පදනමට නීත්‍යානුකූලව නිර්ණායක ඇති විට සහ ප්‍රමාණයන් ගණනය කළ හැක විට ය.

3.9.2 ආදායම

උපයන පොළිය උපචිත පදනම මත හඳුනා ගැනේ.

දේපළ, පිරියත සහ උපකරණ අපහරණය කිරීමේ ශුද්ධ ලාභ සහ අලාභ, අපහරණය කිරීමෙන් ලැබෙන ආදායම, අපහරණය කරන ලද භාණ්ඩයේ ධාරණ අගය සහ ඊට අදාළ ඕනෑම විකුණුම් වියදම් වලින් අඩු කිරීමෙන් පසු විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. අපහරණය කරන ලද වත්කම්වල වටිනාකම ප්‍රාග්ධන සංචිතයෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ. නැවත තක්සේරු කළ වත්කම් සම්බන්ධයෙන්, නැවත තක්සේරු කිරීමේ සංචිත ගිණුමේ ඉතිරිව ඇති ඕනෑම ශේෂයක් විස්තීරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ.

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

3.10 වියදම් හඳුනාගැනීම

පදනමේ මෙහෙයුම් සහ අනෙකුත් ක්‍රියාකාරකම් සිදුකිරීමේ වියදම්, ඒවා දරනු ලබන කාල සීමාව තුළ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත. පදනම පරිපාලනය කිරීමේදී සහ පවත්වාගෙන යාමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ අපේක්ෂිත මට්ටමින් ක්‍රියාත්මක වීමට දරන ප්‍රතිසංස්කරණය කිරීමේ සහ නඩත්තු කිරීමේ අනෙකුත් වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කර විස්තීරණ ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

සටහන 4 - දේපල, පිරියක සහ උපකරණ

සටහන 4.1 - දේපල, පිරියක සහ උපකරණ

	2022.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	ප්‍රත්‍යංගණනය	බැහැර කිරීම් / ආපසු හැරවීම්	2022.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය / තක්සේරුව					
මෝටර් රථ (ගිලන් රථ-අදියර 1)	214,387,289	-	247,065,033	(213,527,322)	247,925,000
මෝටර් රථ (ගිලන් රථ-අදියර 2 සහ 3)	780,599,997	400,440,000	-	-	1,181,039,997
තොරතුරු තාක්ෂණ උපකරණ	136,510,496	447,310	-	(2,084,267)	134,873,539
ගෘහ භාණ්ඩ සහ උපකරණ	31,908,860	544,105	-	-	32,452,965
වෛද්‍ය උපකරණ	185,360,024	20,398,236	-	(1,663,597)	204,094,663
මිදුකාංග	17,511,041	6,601,851	-	(159,343)	23,953,548
මෙවලම්	7,676,382	233,458	-	(32,770)	7,877,070
කාර්යාල උපකරණ	9,143,684	64,330	-	-	9,208,014
	1,383,097,773	428,729,290	247,065,033	(217,467,299)	1,841,424,796

	2022.01.01 දිනට ශේෂය	වර්ෂය සඳහා අය කිරීම්	ආපසු හැරවීම්	බැහැර කිරීම්	2022.12.31 දිනට ශේෂය
	රු.	රු.		රු.	රු.
පිරිවැය / තක්සේරුව මත ක්ෂය වීම්					
මෝටර් රථ (ගිලන් රථ-අදියර 1)	194,958,455	28,922,334	(213,527,322)	-	10,353,467
මෝටර් රථ (ගිලන් රථ-අදියර 2 සහ 3)	424,870,872	130,100,000	-	-	554,970,872
තොරතුරු තාක්ෂණ උපකරණ	80,347,436	22,098,151	(2,084,267)	-	100,361,320
ගෘහ භාණ්ඩ සහ උපකරණ	19,039,910	4,029,522	-	-	23,069,432
වෛද්‍ය උපකරණ	73,831,449	23,391,818	(106,708)	(928,785)	96,187,774
මිදුකාංග	12,172,990	2,443,643	(159,343)	-	14,457,290
මෙවලම්	3,775,996	1,622,980	-	(22,939)	5,376,037
කාර්යාල උපකරණ	2,103,576	1,833,655	-	-	3,937,232
	811,100,685	214,442,103	(215,877,640)	(951,724)	808,713,424

	2022.12.31 දිනට ශේෂය	2021.12.31 දිනට ශේෂය
	රු.	රු.
පිරිවැය / තක්සේරුව මත වත්කම්වල ඉද්ධ පොත් වටිනාකම		
මෝටර් රථ (ගිලන් රථ-අදියර 1)	237,571,533	19,428,834
මෝටර් රථ (ගිලන් රථ-අදියර 2 සහ 3)	626,069,125	355,729,125
තොරතුරු තාක්ෂණ උපකරණ	34,512,218	56,163,059
ගෘහ භාණ්ඩ සහ උපකරණ	9,383,533	12,868,950
වෛද්‍ය උපකරණ	107,906,889	111,528,575
මිදුකාංග	9,496,258	5,338,051
මෙවලම්	2,501,033	3,900,386
කාර්යාල උපකරණ	5,270,782	7,040,108
	1,032,711,371	571,997,088

සටහන 4.2 - මෝටර් රථ වලට එකතු කිරීම්

මුදල් අමාත්‍යාංශය විසින් මූල්‍ය ධෑ ඖවිසුමක් යටතේ ලබාගත් ටොයෝටා ගිලන්රථ 25ක් පදනමට ලැබී ඇති අතර ලීසිං වාරික ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලැබේ. සියලුම ගිලන්රථ 1990 සුවසැරිය පදනම යටතේ ලියාපදිංචි කර පරම කිරීකරු ලෙස ලංකා බැංකුව වෙත පවරා ඇත. මේවා පුරව ගිලන්රථ සේවයට සුදුසු පරිදි පිරිසකර අවශ්‍ය උපකරණ සවි කර නොතිබූ අතර පිරිසැකසීමට පෙර ගිලන් රථයක මිල රුපියල් 15,950,000 කි. දැනට එක් ගිලන් රථයක් පිරිසකසා ඇති අතර සම්පූර්ණ පිරිවැය පහත පරිදි වේ.

	2022.12.31
	රු.
ටොයෝටා ගිලන්රථ 25ක මිල	398,750,000
1 ගිලන් රථයක පිරිසැකසුම් පිරිවැය	1,690,000
වසර අවසානයේ ශේෂය	400,440,000

නව ටොයෝටා ගිලන්රථ 25 සඳහා මිලදී ගත් Stretchers 25ක මිල රුපියල් 18,500,000 ක් වෛද්‍ය උපකරණ යටතේ දක්වා ඇත.

සටහන 4.3 - මෝටර් රථ නැවත තක්සේරු කිරීම්

සටහන 4.3.1 - අදියර 1 මෝටර් රථ (ගිලන් රථ) 2022 ඔක්තෝම්බර් 31 වන දිනට ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවෙකු වන Gamut Ceylon Valuers (Pvt.) Ltd විසින් පවතින හොඳම පදනම් අනුව විවෘත වෙළඳපල වටිනාකම මත නැවත තක්සේරු කරන ලදී. විවෘත වෙළඳපල වටිනාකම් ක්‍රමයේදී සමාන හෝ සැසඳිය හැකි වත්කම් සහ වගකීම් සම්බන්ධ වෙළඳපල ගනුදෙනු මඟින් ජනනය කරන ලද මිල ගණන් සහ අනෙකුත් අදාළ තොරතුරු භාවිතා කරයි.

1990 සුව සැරිය පදනම පිටුව **12**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

සටහන 4.3 - මෝටර් රථ ප්‍රත්‍යාගණනය (සම්බන්ධිතයි.)

සටහන 4.3.2 - ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් රථවල ශුද්ධ පොත් වටිනාකම් පිරිවැය ආකෘතිය යටතේ නම් පහත පරිදි හඳුනා ගැනීමට ඉඩ තිබුණි:

	2022.12.31 රු.	2021.12.31 රු.
දිනට පිරිවැය	214,387,289	214,387,289
සමුච්චිත ක්ෂයවීම්	(213,527,322)	(194,958,455)
දිනට ශුද්ධ පොත් වටිනාකම	859,967	19,428,834

සටහන 4.3.3 - 2022 වර්ෂය සඳහා ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් රථවල ක්ෂයවීම් පහත පරිදි ගණනය කර ඇත;

	2022.12.31ත් අවසන් වසර සඳහා
ජනවාරි 2022 - සැප්තැම්බර් 2022	18,568,867
ඔක්තෝබර් 2022 - දෙසැම්බර් 2022	10,353,467
අදියර 1 ගිලන්රථවල ක්ෂයවීම් ගාස්තු	28,922,334

	2022.12.31 රු.	2021.12.31 රු.
සටහන 5 - කොඟය		
ඖෂධ, සහ වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍ය - (සටහන (අ))	53,528,106	55,080,593
ලිපි ද්‍රව්‍ය සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය	1,419,385	2,277,106
	54,947,491	57,357,699

සටහන (අ) : මෙම අඟය, ගිලන්රථ 295 ක් සඳහා දිවයින පුරා බෙදා හරිනු ලබන ඖෂධ, වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍ය, වෛද්‍ය උපකරණ සහ අදාළ වෙනත් ද්‍රව්‍යයන් නියෝජනය කරයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබුණු රුපියල් 11,194,053 වටිනා පරිභෝජන ද්‍රව්‍ය කොගද මෙහි ඇතුළත් වේ.

සටහන 6 - අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ		
ආරක්ෂක තැන්පතු	9,817,250	9,810,250
අත්තිකාරම් - (සටහන (ආ))	23,915	5,653,212
පෙරගෙවුම් සහ ලැබිය යුතු මුදල්	23,538,172	31,866,357
ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු මුදල් - (සටහන 6.1)	330,091,526	330,091,526
	363,470,864	377,421,345
සටහන 6.1- ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු මුදල්		
වසර මුලදී ශේෂය	330,091,526	405,224,284
ශ්‍රී ලංකා රජයෙන් වර්ෂය තුළ ලැබුණු අරමුදල්	-	(62,201,514)
සීමා කරන ලද අරමුදල් වෙත මාරු කිරීම් -ඉන්දීය රජයේ ප්‍රදාන (සටහන 9)	-	(12,931,244)
වසර අවසානයේ ශේෂය	330,091,526	330,091,526

සටහන (ආ) : 2018 වර්ෂයෙදී Vive Solution- India වෙත ගෙවා තිබූ රු. 2,545,753.67 ක අත්තිකාරම් මුදල අයකරගත නොහැකි අත්තිකාරම් ලෙස 2022 දී මූල්‍ය ප්‍රකාශනවලින් කපා හරින ලදී.

සටහන 7 - මුදල් සහ මුදල් සමාන දෑ		
ලංකා බැංකුව - ශ්‍රී ලංකා රුපියල් ගිණුම්	168,585,557	19,793,364
ලංකා බැංකුව - ඇමෙරිකානු ඩොලර් ගිණුම්	677,117,906	461,447,980
	845,703,463	481,241,344
සටහන 8 - නම් කරන ලද සංචිත - ප්‍රාග්ධන - ඉන්දීය රජයෙන් ලද ප්‍රදාන		
වසර මුලදී ශේෂය	561,417,085	743,467,107
සීමා කරන ලද අරමුදල් වලින් මාරු කිරීම් - ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන - (සටහන 9)	8,054,949	53,814,473
වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධි වූ සංචිත - (සටහන 18)	(637,936)	(8,076,234)
ප්‍රත්‍යාගණනය කිරීම මත උපලබ්ධි නොවූ සංචිතය - (සටහන 11)	(859,967)	-
දේපල, පිරියක හා උපකරණ ක්ෂය වීම	(201,803,376)	(227,788,260)
වසර අවසානයේ ශේෂය	366,170,755	561,417,085

1990 සුව සැරිය පදනම් පිටුව **13**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

	2022.12.31 රු.	2021.12.31 රු.
සටහන 9 - සීමා කරන ලද අරමුදල් - ඉන්දීය රජයෙන් ලද ප්‍රදාන		
වසර ආරම්භයේ දී ශේෂය	813,605,704	932,975,592
වර්ෂය තුළ වෙනත් මාරු කිරීම්	-	4,670,803
ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු මුදල් වෙත මාරු කිරීම් - (සටහන 6.1)	-	(12,931,244)
නම් කරන ලද සංචිත වෙත මාරු කිරීම් -ප්‍රාග්ධන- ඉන්දීය රජයෙන් ලද ප්‍රදාන-(සටහන 8)	(8,054,949)	(53,814,473)
විස්තිරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කිරීම් - (සටහන 15)	(126,116,537)	(57,294,975)
වසර අවසානයේ ශේෂය	679,434,218	813,605,704
සටහන 10 - නම් කරන ලද සංචිත- ප්‍රාග්ධන -ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රදාන		
වසර ආරම්භයේ දී ශේෂය	-	-
ප්‍රදාන වශයෙන් ලැබුණු ගිලන්රථ	398,750,000	-
සීමා කරන ලද අරමුදල් වලින් මාරු කිරීම් - නව ගිලන්රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන - (සටහන 14)	20,190,000	-
වසර අවසානයේ ශේෂය	418,940,000	-
සටහන 11 - ප්‍රත්‍යාගණන සංචිතය		
වසර ආරම්භයේ දී ශේෂය	-	-
මෝටර් රථවල ප්‍රත්‍යාගණන අතිරික්තය	247,065,033	-
ප්‍රත්‍යාගණනය කිරීම මත උපලබ්ධි නොවූ සංචිත - (සටහන (ඇ))	859,967	-
වසර අවසානයේ ශේෂය	247,925,000	-

සටහන (ඇ): පළමු අදියරේ මෝටර් වාහන ප්‍රත්‍යාගණනය මත උපලබ්ධි නොවූ රුපියල් 859,967 ක සංචිතය එම වත්කම්වල ශුද්ධ පොත් අගය මත හඳුනාගෙන ඇති අතර, එම වත්කම් ප්‍රාග්ධන සංචිතය හරහා දේපළ, පිරියක සහ උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශන වෙත මුලින් ගෙන එන ලද අතර වාර්ෂික ක්ෂයවීම් එම සංචිතයට එදිරිවම සිදු කර තිබුණි.

සටහන 12 - සේවක ප්‍රතිලාභ		
වසර ආරම්භයේ දී ශේෂය	87,832,625	62,356,750
විස්තිරණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනාගත් වියදම්	24,967,000	26,025,875
වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්	(900,000)	(550,000)
වසර අවසානයේ ශේෂය	111,899,625	87,832,625
සටහන 13 - වෙනත් ගෙවිය යුතු		
ව්‍යවස්ථාපිත විගණන ගාස්තුව	200,000	390,800
ගෙවිය යුතු රැඳවුම් තැන්පතු - (සටහන (ඇ))	-	3,711,837
සේවක භාරකාර අරමුදල	1,461,101	1,540,499
සේවක අර්ථසාධක අරමුදල	9,740,675	10,269,992
ගෙවිය යුතු මෘදුකාංග ගාස්තු	1,000,000	1,937,415
උපචිත වියදම්	10,471,974	17,315,586
ගෙවිය යුතු වෙනත් සැපයුම්කරුවන් සහ ණය හිමියන්	83,078,496	41,361,838
	105,952,247	76,527,967

සටහන (ඇ) : 2016 වසරේ සිට සැපයුම්කරුවන් හිමිකම් නොපෑ රුපියල් 3,711,837 ක රඳවා තබා ගැනීමේ මුදල්, 2022 මූල්‍ය ප්‍රකාශවල වෙනත් ආදායම් ලෙස හඳුනා ගනු ලැබීය.

සටහන 14 - සීමා කරන ලද අරමුදල්- නව ගිලන් රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		
වසර ආරම්භයේ දී ශේෂය	-	-
නව ගිලන්රථ 25ක් පිරිසකර කිරීම සහ අවශ්‍ය උපකරණ සහ මිලදී ගැනීමට ලැබුණු අරමුදල්	145,000,000	-
නම් කරන ලද සංචිත වෙත මාරු කිරීම්-ප්‍රාග්ධන- ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රදාන-(සටහන 10)	(20,190,000)	-
වසර අවසානයේ ශේෂය	124,810,000	-

	2022.12.31 දිනට ශේෂය රු.	2021.12.31 දිනට ශේෂය රු.
සටහන 15 - ලැබූ අදායම්		
ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු මුදල්වලට අනුව හඳුනාගත් ආදායම්	2,044,120,000	2,048,000,000
ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ඖෂධ සහ වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍යවලට අනුව හඳුනාගත් ආදායම්	13,650,910	-
ඉන්දියානු රජයෙන් ලැබෙන ප්‍රදානවලට අනුව හඳුනාගත් ආදායම්-(සටහන 9)	126,116,537	57,294,975
	2,183,887,447	2,105,294,975

1990 සුව සැරිය පදනම පිටුව 14

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

	2022.12.31න් අවසන් වසර සඳහා රු.	2021.12.31න් අවසන් වසර සඳහා රු.
සටහන 16 - ඍජු වියදම්		
ගිලන් රථ ඔක්සිජන් වියදම	2,422,228	2,343,523
ගිලන් රථ සැපයුම්	96,194,986	260,394,005
කාර්ය මණ්ඩල වැටුප්	600,004,963	622,047,122
සේවක අර්ථසාධක අරමුදල	72,000,596	74,645,655
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	18,000,149	18,661,414
අතිකාල දීමනා	429,967,103	534,691,858
ගමන් වියදම් සහ වෙනත් දීමනා	89,802,104	43,358,501
ඉන්ධන වියදම්	369,627,694	173,466,383
ඉන්ධන කාඩ්පත් ගාස්තු - NTB	1,890,446	-
අලුත්වැඩියාව සහ නඩත්තුව	204,247,370	168,840,849
කාර්ය මණ්ඩල නිල ඇඳුම්	1,312,118	7,097,405
වාහන රක්ෂණය	47,159,469	25,637,563
දුරකථන ගාස්තු	31,740,204	27,912,328
	1,964,369,430	1,959,096,604
සටහන 17 - වක්‍ර වියදම්		
ප්‍රචාරණ වියදම් - (සටහන (ඉ))	1,626,822	10,601,516
බැංකු ගාස්තු	310,172	423,445
විදුලි ගාස්තු	5,152,481	5,000,727
ඉන්ධන කාඩ්පත් ගාස්තු	415,380	356,760
ඉන්ධන වියදම් - වෙනත්	4,705,001	2,082,756
සාමාන්‍ය පරිපාලන වියදම්	81,631	114,698
කම්කරු වන්දි රක්ෂණය	713,723	707,809
පුද්ගලික අනතුරු රක්ෂණය	2,122,256	2,180,421
අන්තර්ජාල සහ රූපවාහිනී වියදම්	46,450,972	29,065,835
නීතිමය ගාස්තු	272,500	325,250
දේශීය ගමන් වියදම් සහ ප්‍රවාහන වියදම්	42,279,027	42,418,997
නවාතැන් සහ ආහාර වියදම්	1,004,940	1,089,500
ක්ෂය වීම	12,638,728	1,904,835
කාර්යාල පිරිසිදු කිරීමේ වියදම්	1,428,837	1,938,475
කාර්යාල නඩත්තු සහ අනෙකුත් කාර්යාල වියදම්	1,042,176	1,023,231
සේවා ගාස්තු	1,873,890	1,609,845
තැපැල් ගාස්තු	318,077	172,842
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය වියදම්	1,451,315	1,204,671
විගණන ගාස්තු	192,600	129,800
වෘත්තීය ගාස්තු	28,369,188	27,863,965
කුලී වියදම්	19,482,704	18,356,577
ආරක්ෂක ගාස්තු	4,056,928	3,573,109
මෘදුකාංග සහාය ගාස්තු	6,474,671	5,271,413
කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ වියදම්	5,342,433	1,835,750
කාර්ය මණ්ඩල සුඛසාධන වියදම් සහ කාර්යාල පරිභෝජන භාණ්ඩ	3,480,039	62,702,938
GPS වියදම	7,911,910	7,776,450
කොරතුරු තාක්ෂණ සහ අදාළ වියදම් සහ වාර්ෂික නඩත්තු වියදම්	1,527,532	1,544,546
කාර්යාල අලුත්වැඩියා වියදම්	-	681,962
කාර්ය මණ්ඩල විශ්‍රාම පාරිතෝෂිකය	24,967,000	26,025,875
බාහිරින් ලබාගත් කාර්ය මණ්ඩල සඳහා පිරිවැය	43,314,093	7,613,702
ජංගම දුරකථන සහ උපාංග නඩත්තු කිරීම්	3,237,200	5,026,300
මුද්දර ගාස්තු	72,156	236,606
ජල ගාස්තු	243,429	158,508
ඉලෙක්ට්‍රොනික උපකරණ රක්ෂණය	211,259	99,399
උපකරණ නඩත්තු කිරීම	1,432,412	536,300
ගිනි රක්ෂණය - ව්‍යාපාර පරිශ්‍ර රක්ෂණය	296,373	195,760
අත්තිකාරම් කපා හැරීම් - (සටහන (ආ))	2,545,754	-
ස්ථාවර වත්කම් බැහැර කිරීමේ අලාභය - (සටහන 20.1)	637,936	2,889,458
	277,683,545	274,740,032

සටහන (ඉ) : පුවත්පත් දැන්වීම් සඳහා ගෙවූ රුපියල් 245,560 ක් සහ මාධ්‍ය ප්‍රචාරණය සඳහා කළ රුපියල් 1,626,822 ක වියදම් ප්‍රචාරණ වියදම් වල ඇතුළත් වේ. 1990 සුවසැරිය පදනමේ අරමුදලින් ප්‍රවෘත්ති පත්‍ර දැන්වීම් සඳහා මුදල් ගෙවා ඇති අතර මාධ්‍ය ප්‍රචාරණ වියදම් එම අරමුණ සඳහාම ලැබුණු පරිත්‍යාග මඟින් මුදල් ගෙවා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

සටහන 18 - වෙනත් ක්‍රියාකාරකම් වලින් ඉපැයූ ආදායම

	2022.12.31න් අවසන් වසර සඳහා රු.	2021.12.31න් අවසන් වසර සඳහා රු.
විදේශ විනිමය හුවමාරු ලාභය	338,633,192	43,776,509
සුන්බුන් විකුණුම් සහ වෙනත් ආදායම්	5,169,362	2,537,815
පරිත්‍යාග	2,026,047	13,745,880
ගිලන්රථ බැහැර කිරීම මත ලාභය	-	5,096,612
වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධි වූ සංචිත - (සටහන 20.2)	637,936	8,076,234
	346,466,537	73,233,050

සටහන 19 - මූල්‍ය ආදායම

ඉතුරුම් ගිණුමේ පොලී ආදායම්	4,766,240	3,942,706
	4,766,240	3,942,706

සටහන 20 - දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීම

සටහන 20.1 - දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ අලාභය

විස්තර	මිලදී ගත් වර්ෂය	පිරිවැය	සමුච්චිත ක්ෂයවීම්	ලියා හල අගය	විකුණුම් ආදායම්	පොත් පාඩුව
		රු.	රු.	රු.	රු.	රු.
Portable Pulse Oxymeter- සංඛ්‍යාව 154	2016- සංඛ්‍යාව 87, 2018 - සංඛ්‍යාව 48, 2019- සංඛ්‍යාව 19	1,212,531	697,858	514,673	-	(514,673)
Manual BP - වැඩිහිටි - සංඛ්‍යාව 60	2016	64,004	43,417	20,587	-	(20,587)
Manual Suction Devices - සංඛ්‍යාව 13	2016	32,727	22,200	10,526	-	(10,526)
Pneumatic Splints - සංඛ්‍යාව 61	2016	189,987	128,879	61,109	-	(61,109)
Other Tools and Medical Eqipment - සංඛ්‍යාව 85	2016- සංඛ්‍යාව 64, 2018- සංඛ්‍යාව 21	90,410	59,369	31,041	-	(31,041)
		1,589,659	951,723	637,936	-	(637,936)

සටහන 20.2 - වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධි වූ සංචිත

රුපියල් 637,936ක වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධි වූ සංචිත එම වත්කම්වල ශුද්ධ පොත් අගය මත හඳුනාගෙන ඇති අතර, එම වත්කම් ප්‍රාග්ධන සංචිතය හරහා දේපළ, පිරියත සහ උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශන වෙත මුලින් ගෙන එන ලද අතර වාර්ෂික ක්ෂයවීම් එම සංචිතයට එදිරිවම සිදු කර තිබුණි.

සටහන 21 - ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට අවශ්‍ය ප්‍රධාන ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොතිබුණි

සටහන 22 - අවිනිශ්චිත වගකීම්

මූල්‍ය ප්‍රකාශනවල ඇලපිම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන අවිනිශ්චිත වගකීම් කිසිවක් නොතිබුණි.

සටහන 23 - ශේෂ පත්‍රයේ දිනයට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම අවශ්‍ය වන වෙනත් සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදු නොවීය.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එම්ඊබී/බී/1990එස්එස්/01/2022/46

මෙම අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි 04 දින

සභාපති,
1990 සුවසැරිය පදනම

1990 සුවසැරිය පදනමේ **2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එම්.එස්.නයනකුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් - 01. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
02. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එම්ඊඩ්ඩ/බී/1990එස්එෆ්/01/2022/46 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 03 දින

සභාපති,
1990 සුවසැරිය පදනම

1990 සුවසැරිය පදනමේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

1990 සුවසැරිය පදනමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 සුවසැරිය පදනමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සුවසැරිය පදනමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

පදනමේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධිවිධාන වලට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 139(5)	වවුවර්වලට මුදල් ගෙවීමේදී ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු කර ගත යුතු වුවත්, රු.1,638,491 ක් වූ වවුවර් 31 ක් සඳහා ගෙවීම් කිරීමේදී වවුවරය මතුපිට මුදල් භාරගත් බවට ආදායකයාගේ අත්සන හෝ මුදල් භාරගත් බවට කුවිතාන්සියක් හෝ නොවීය.

	(ii) මුදල් රෙගුලාසි 264(1)	සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත් අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ කුවිතාන්සියකින් තහවුරු කළ යුතු වුවත් රු. 21,895,615 ක් වටිනාකම වූ වවුචර්පත් 18 ක් සඳහා කුවිතාන්සි ලබා ගෙන නොතිබුණි
(ආ)	2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහය/ අත්පොත	
	(i) මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය	ජාතික ප්‍රතිපත්ති රාමුවක් තුළ ආයතන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික විය යුතු අතර එම සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය සමඟ අමාත්‍යාංශයේ ලේකම් හරහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවද පදනම විසින් එසේ සිදුකර නොතිබුණි.
	(ii) මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 ඡේදය	පදනම විසින් වාර්ෂික අයවැය ලේඛනය පිළියෙළ කිරීමේදී ඇමුණුම I හි 3 (a) හි සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.
	(iii) මාර්ගෝපදේශ අත්පොතෙහි 6.7 ඡේදය	ස්ථාවර වත්කම් හා ගබඩා පිළිබඳව වාර්ෂිකව වත්කම් සත්‍යාපනයක් සිදු කළ යුතු වුව ද පදනම විසින් ස්ථාවර වත්කම් සත්‍යාපනයක් සිදු කර නොතිබුණි.
(ඇ)	2014 පෙබරවාරි 17 දිනැති අංක PFD/RED/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04 ඡේදය	දිගුකාලීන දැක්මක් සහිතව අදාළ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි චක්‍රලේඛයේ (අ), (ආ), (ඇ), (ඉ) සහ (ඊ) යන කරුණු ඇතුළත් කර නොතිබුණි.
(ඈ)	ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 9.1 වගන්තිය	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, නිලධාරියෙක් වෙත කිලෝමීටරයට රු.2.00 ක සැහපුම් කුලියක් ගෙවිය හැකි නමුත්, එම විධිවිධානවලට පටහැනිව හා ආයතන අධ්‍යක්ෂකගෙන් ලබාගත් විධිමත් අනුමැතියකින් තොරව, ගිලන් රථ සේවාව අධීක්ෂණ කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් මට්ටමින්

ස්ථානගත කර තිබුණු අධීක්ෂණ නිලධාරීන්ට ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා තම පෞද්ගලික යතුරුපැදිය භාවිතා කිරීමටත් ඒ සඳහා පදනම විසින් කිලෝමීටරයකට රු.23 සිට රු. 48 දක්වා විවිධ රේටයන් 7 ක් යටතේ ගෙවීම් කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව 2022 වර්ෂය තුළ අවස්ථා 191 කදී කිලෝ මීටර 295,400 ක් සඳහා රු. 9,787,851 ක් ගෙවා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 සහ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑමඒ/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය

නියාමන සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගෙන 2021 දෙසැම්බර් 30 දින පදනම වෙත ලබාදී තිබුණු ගිලන් රථ 25 භාවිතයට ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණු අතර මෙම ගිලන් රථ මෙම පදනම විසින් සපයනු ලබන සේවාවන්වලට ගැලපෙන පරිදි වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් සැපයුම්කරුගේ රථ ගාලක් තුළ නවතා තිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 1,992 ක් වුවද, එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 1,307 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩල ඌනතාවය 685 ක් වූ අතර ඒ අතරින් 321 දෙනෙකු ගිලන් රථ රියදුරන් විය.

(ඇ) ඉහල කළමනාකරණ තනතුරක් වූ මූල්‍ය ප්‍රධානි (Head of Finance) තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා පවත්වා තිබුණු සම්මුඛ පරීක්ෂණයට අනුව එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයන් මත අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ මූල්‍ය උපදේශකයෙකු ලෙස නිලධාරියෙකු මාස 06 ක කාලයක් සඳහා 2021 සැප්තැම්බර් 02 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. පත්කිරීම් කොන්දේසි ප්‍රකාරව තවත් මාස 06කට පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කළ හැකි වුවද 2023 අප්‍රේල් 19 දින දක්වා තවත් වැඩිපුර මාස 06 ක කාලයකින් මොහුගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.

පිටුව 6 | 7

එසේම මූල්‍ය හා සැපයුම් දාම කළමනාකරු තනතුර දරන නිලධාරිණිය හට ද 2021 අගෝස්තු 21 දින සිට එක් වසරක පරිවාස කාලයකට යටත්ව වැඩබලන මූල්‍ය ප්‍රධානී තනතුර සඳහා උසස්වීමක් ලබා දී තිබුණු අතර පත්කිරීම් කොන්දේසි ප්‍රකාරව එම නිලධාරිනිය විසින් මූල්‍ය ප්‍රධානී තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් වර්ෂයක් ඇතුළත සම්පූර්ණ කරගත යුතු අතර පරිවාස කාලය මාස 03 ක් දක්වා දීර්ඝ කළ හැකි විය . නමුත් විධිමත් අනුමැතියක් රහිතව එම නිලධාරිනිය 2023 මාර්තු 31 දින වන විටත් මූල්‍ය ප්‍රධානී තනතුරේ වැඩ බැලීම සිදු කරන බව නිරීක්ෂණය විය.

(ඇ) 2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා පෞද්ගලික සමාගමක් සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම හා 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 26 (ඇ) වගන්තිය ප්‍රකාරව, සුවසැරිය පදනමේ මෙහෙයුම් කටයුතු සඳහා වැය වන පුනරාවර්තන වියදම් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු වුවද, 2022 ජනවාරි 01 දින වන විට පැවති රු.330,091,526 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රතිපූර්ණය කර නොතිබුණි. එසේම 2019 වර්ෂය සඳහා රජය විසින් පදනමට ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදනය 2021, 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් සියයට 25 ක් සියයට 50 ක් හා සියයට 75 ක් දක්වා අඩුකිරීමට 2019 අගෝස්තු 27 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර මූල්‍ය ප්‍රතිපාදන අඩුකිරීමෙන් පසුව පදනම පවත්වාගෙන යාම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණි. නමුත් එවැනි යොජනාවක් 2023 මාර්තු 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම තත්ත්වය පදනමේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සෘජු බලපෑමක් එල්ල විය හැකි බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.293,067,249 ක අතිරික්තයක් වූ අතර රටට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.51,365,905 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.344,433,154 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පදනමේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි හුවමාරු අගය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති



ANNUAL REPORT 2022